# පැරණි ශ්‍රී ලංකාවේ ආරාමික අධ්‍යාපනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එම්.මධුකා රුවන්ති උපාලි[1]

## හැඳින්වීම

ආරම මුල් කරගත් අධ්‍යාපන ක්‍රමය බුදුදහම මානව ශිෂ්ටාචාරයට උරුම කොට දෙන අගනා දායාදයකි. බුදුන් වහන්සේගේ ඉගැන්වීම් සම්ප්‍රදාය සමාජීය පුද්ගලයා තුළ මෙන් ම තමා ජීවත් වන ලෝකය පිළිබඳ පරිපූර්ණ අධ්‍යාපනයක් ලබා දෙන ඉගැන්වීමකි. පස්වග මහණුන්ගෙන් ආරම්භ වූ මෙම අධ්‍යාපන ක්‍රමවේදය ඉන්දියාවේ විවිධ භික්ෂු ආරාමවල ව්‍යාප්ත වී දියුණු විය. ලක්දිව ආරාමික අධ්‍යාපනය ආරම්භ වූයේ දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ මිහිඳු මහරතන් වහන්සේගේ ආගමනයත් සමඟ ය. දෙවනපෑතිස් සමයේ දී විශාල පිරිසක් බුදුසමය වැළඳ බුදුසසුනේ පැවිදි වූහ. මෙම පිරිස ධර්මදූතයන් වහන්සේ යටතේ පුළුල් ව බුද්ධධර්මය ද භාෂා ද උගත්තෝ ය. මෙම ලාංකේය භික්ෂූන් වහන්සේ ශ්‍රී ලංකාවේ පළමු ආරාම ශිෂ්‍ය පරපුර ලෙස සැලකිය හැකි ය. මේ සමඟ ම මහා විහාරය, චේතියගිරිය, ථූපාරාමය, ඉසුරුමුණිය, දඹකොළ වෙහෙර, තිස්සමහාරාමය වැනි ආරම දිවයින පුරා ස්ථාපනය විණි. එකී සෑම ආරාමයක් ම ආගමික ස්ථානයක් මෙන් ම පාසලක් ද විය. මෙම ආයතන අතර මහා විහාරය ථෙරවාදීන්ගේ ප්‍රධාන ගුරුකුලය වූ අතර, පසු කාලයේ දී ලෝකයේ මහත් කීර්තියට පත් අධ්‍යාපනික මධ්‍යස්ථානයක් එනම් විශ්වවිද්‍යාලයක් ලෙස දියුණු වූයේ ය. ආරාම අධ්‍යාපනයෙහි සාර්ථක ගුරු-ගෝල සම්බන්ධතාවක් තිබූ බව පැහැදිලි වන අතර, ශිෂ්‍යයා දැනුමින් පමණක් නො ව කුසලතා ආකල්පවලින් සන්නද්ධ කරවීමට මෙම අධ්‍යාපන ක්‍රමය බෙහෙවින් බලපෑවේ ය.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම ශාස්ත්‍රිය පර්යේෂණය සිදු කිරීමේ දී තොරතුරු ලබා ගැනීම පිණිස අනුගමනය කරන ලද පර්යේෂණ ක්‍රමවේදය වන්නේ සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය යි. ප්‍රාථමික මූලාශ්‍රය මෙන් ම ද්විතීයික මූලාශ්‍රය යටතේ සාහිත්‍ය ග්‍රන්ථ උපයෝගී කර ගනිමින් අධ්‍යයනය සිදු කර අවසන් නිගමනය කරා එළඹ ඇත.

## පර්යේෂණ් අරමුණ හා වැදගත්කම

පැරණි ලක්දිව ආරාමික අධ්‍යාපන ව්‍යූහය කෙසේ පැවතියේ ද? යන්න හඳුනා ගැනීම ප්‍රධාන අරමුණ වේ. වත්මන් සමාජයේ පැරණි ආරාමික අධ්‍යපනය පිළිබඳ ව අඩු අවධානයක් යොමුවන බැවින් ඒ පිළිබඳ ව අධ්‍යයනය කිරිම කාලානුරූපී ව වැදගත් වේ.

## පර්යේෂණ ගැටලුව

පැරණි ලක්දිව ආරාමික අධ්‍යාපන ව්‍යූහය කෙසේ පැවතියේ ද? යන්න මෙහි දී විමර්ශනයට ලක් විය.

[1]. ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය. *ruwanthimaduka123@gmail.com*

**පර්යේෂණ සාකච්ඡාව**

දැනුම ලබා දීම ආරාමික අධ්‍යාපනයේ මූලික අරමුණක් වේ. ග්‍රන්ථධූරීණ භික්ෂූන් වහන්සේලා ප්‍රධාන වශයෙන් ආරාමවල ඉගෙනීමේ හා ඉගැන්වීමේ ක්‍රියාවලියේ නිරත වූහ. පසු කාලයේ දී ආරාමික අධ්‍යාපන විෂයමාලාවට වෙනත් බොහෝ විෂයයන් ද ඇතුළත් විමත් සමඟ ම බුද්ධවචනය ගැන පමණක් නො ව භාෂාශාස්ත්‍ර, දර්ශන හා ශිල්ප කර්මාන්ත පිළිබඳ දැනුම ලබා දීම ද ආරාමික අධ්‍යාපනයේ මූලික අරමුණක් විය. ආකල්ප වර්ධනය හා සදාචාර සම්පන්න පුද්ගලයකු බිහි කිරීම ගුරුවරු තමන්ගේ ප්‍රධාන යුතුකම ලෙස සැලකීය. කුසලතා වර්ධනය ද ආරාමික අධ්‍යාපනයේ අරමුණකි. ආරාමයක ඉගෙන ගන්නා ශිෂ්‍යයකු විසින් හුරු පුරුදු විය යුතු ඇමදීම, ගෙත්තම් පන්නම් කිරීම, පිළිසකර කිරිම වැනි කටයුතු හා දිනපතා ඉටු කළ කුදු මහත් කාර්යයන් හේතුවෙන් ඔහුගේ අධ්‍යාපනය පොතට පමණක් සීමා නො වූ අතර, හසුරු කෞශල්‍ය ද වර්ධනය විය.

**විෂයමාලාව**

මුල සිටම ආරමවල ඉගැන්වූ වැදගත් ම ප්‍රධාන විෂය වූයේ පර්යාප්තිය යි. අරාමවල අධ්‍යාපනය ලැබූ ගිහි පැවිදි සියලලෝ ම පර්යාප්තිය හදාළෝ ය. එකල අරාමවල බුද්ධධර්මය විෂය කිහිපයකට බෙදා උගන්වන ලදී. දීඝනිකාය, මජ්ඣිමනිකාය, විනය, අභිධර්මය වැනි ත්‍රිපිටකයේ කොටස් ද ඉගැන්වූහ. ඉතිහාසය ආරාමවල උගන්වන ලද ඉතා ම ජනප්‍රිය විෂය වූ අතර, ඊට අමතර ව කියවීම, ලිවීම, ගණිතය වැනි විෂයන් ද උගන්වා තිබේ. වෛද්‍යවිද්‍යාව හා නක්ෂත්‍රය ද උගන්වා ඇති බවට සාධක ලැබේ.

**ගුරුභූමිකාව**

පැරණි ශ්‍රී ලංකාවේ ආරාමික අධ්‍යාපන ක්‍රමයෙහි ගුරුවරයකු වශයෙන් පිළිගත්තේ ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරාලූ අයකු පමණි. දැනුම සදාචාරය සම්පන්න බව හා වයසත් සමඟ ලබන පළපුරුද්ද ගුරුවරයකුගේ මූලික සුදුසුකම් ලෙස සැලකුහ. ඒ අනුව ගුරුවරයකු විය හැකි වූයේ ව්‍යක්ත ප්‍රතිබල බහුශ්‍රැතයකුට පමණි. ආරාමවල ගුරුවරු උපජ්ඣාය හා ආචරිය යන නම්වලින් හඳුන්වා තිබේ. ගුරුවරයා ශිෂ්‍යයාට උද්දෙසයෙන් හා අනුශාසනාවෙන් සඞ්ග්‍රහ කළ යුතු විය. විශේෂයෙන් බෞද්ධ ආරාමවල ගුරුවරුන් ශිෂ්‍යයන්ට ධර්මශාස්ත්‍රය උගන්වන ලද්දේ කිසිඳු ලාභ අපේක්ෂාවක් නොමැති ව නිශ්ශරණාධ්‍යාශයෙනි. එසේ ම ආරාමික ගුරුවරු හුදෙක් වැටුපක් සඳහා ඉගැන්වීම් නො කළත් පසු කාලයේ දී වැටුප් ලබා දීමේ ක්‍රමයක් සංවිධානය වී තිබූ බව හඳුනා ගත හැකි විය.

**ශිෂ්‍යභූමිකාව**

ආරාමික ගුරුවරුන් ඉගැන්වීම සඳහා ශිෂ්‍යයකු භාර ගැනීමේ දී ඔහුගේ අභියෝගතාව පිළිබඳ මූලික ව ම පරීක්ෂා කර බැලූහ. ඔහු සතු ව එම දැනුම පැවති නම් ආරාමික අධ්‍යාපනය සඳහා ඔවුන් තෝරා ගත්තේ ය. ආරාමික අධ්‍යාපන ක්‍රමය අනුව ගුරුවරයා ශිෂ්‍යායාගේ භාරකරු විය. ඉගෙනීමේ යෙදෙන අතර, ශිෂ්‍යයෝ ආරාමවල වෙනත් කුදු මහත් කටයුතුවල නිරත වූහ. අලුයම පිබිදීම, ආරාමය ඇමදීම, පිරිසිඳු කිරිම හා ජලය සැපයීම, ගුරුවරයාට උවටැන් කිරිම ශිෂ්‍යයා විසින් කළ යුතු ය.

**ඉගෙනුම හා විනය**

පන්ති පැවැත්වීම අද මෙන් එදා දැනුම ලබා දීමේ ප්‍රධාන මාර්ගය විය. ශිෂ්‍යයන් කිහිපදෙනෙකු සහභාගී වූ පන්ති මෙන් ම ශිෂ්‍යයන් සිය ගණනක් සහභාගී වූ පන්ති ද පවත්වා තිබේ. ශිෂ්‍යයා අධ්‍යාපනය ලබා දෙන කාල සීමාව තුළ ගුරුවරයා සමඟ නේවාසික ව වාසය කළේ ය. ආරාමික දිනචර්යාව අනුව වෙනත් වැඩ කටයුතු සඳහා මෙන් ම ඉගෙනීම සඳහා ද කාලපරිච්ඡේද වෙන් කර තිබිණි. ශිෂ්‍යයන් දැනුම ලබා දුන් මාර්ග ලෙස ධර්මදේශනා, සාකච්ඡා, සම්මේලන, වාදවිවාද, චෛතියචාරිකා දැක්විය හැකි ය. විනය අධ්‍යයනය කිරීම අනිවාර්ය වී තිබූ බව සමන්තපාසාදිකාව, විනයකර්ම, විනයවිභඞ්ග ආදී ග්‍රන්ථවල සඳහන් වේ. එකී මූලාශ්‍රය අධ්‍යයනය කිරීමෙන් ශිෂ්‍යයන්ගේ විනය පරිපූර්ණත්වයට පත් විය.

**පැරණි ආරාමික අධ්‍යාපනයේ සුවිශේෂී ලක්ෂණ**

- ස්ත්‍රී පුරුෂ හෝ කුලභේදය, දුප්පත් පොහොසත් භේදය අධ්‍යාපනයට බාධා නො වීම නිසා සමානාත්මතාව පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක වීම
- වයස්ගත වීමෙන් පසුව ද ඇතැම් පුද්ගලයන් ආරාමවලට ඇතුළත් ව ඉගැන්වීම කටයුතුවල නිරත වීම
- බුදුදහමෙන් ගුරුමුෂ්ටිය රැක ගැනීම අනුමත නො කළ හෙයින් ආරාම අධ්‍යාපන ක්‍රමයේ ද එකී ලක්ෂණය ගැබ් වී පැවතීම
- ශිෂ්‍ය ජීවිතය බ්‍රහ්මචාරී ව ගත කළ යුතු වූ අතර, පෞද්ගලික බැඳීම් ඇති කර ගෙන ඉගෙනීම අඩාළ කර ගැනීමෙන් ශිෂ්‍යයා වළක්වා ගැනීම සඳහා ගුරුවරු උනන්දු වීම

ශිෂ්‍යයා විසින් ගුරුවරයා මඟ පෙන්වීම පැරණි ආරාමික අධ්‍යාපන ක්‍රමයෙහි සිදු විය. බෞද්ධ ආරාමික අධ්‍යාපන ක්‍රමය මනුෂ්‍ය දුර්වලකම් පිළිගත් බව ද ගුරුවරයා වැරදි මඟකට යොමු වුවහොත් ශිෂ්‍යයන් ඥානාන්විත ව ක්‍රියා කොට ගුරුවරයා ආරක්ෂා කරගත යුතු යැයි ද පිළිගෙන තිබිණි. එපමණක් නො ව ගුරුවරයාගේ චරිතය විනය නීතිරීතිවලට අනුව හැඩගස්වා ගැනීමට ද ශිෂ්‍යයා සහය විය යුතු යැයි සැලකිණි.

**ආරාමික අධ්‍යාපනය හා විදේශ සබඳතා**

පැරණි ලංකාවේ ආරාමික අධ්‍යාපනික වශයෙන් වෙනත් රටවල අධ්‍යාපනික ආයතන සමඟ සබඳතා පැවැත් වූ බවට සාධක ලැබේ. විදේශිකයන් ශ්‍රී ලංකාවේ ආරාමවලට පැමිණ ඉගෙනීම හා ඉගැන්වීම කළ අතර, ලාංකිකයන් ද විදේශවලට ගොස් අධ්‍යාපනික කටයුතුවල නිරත වී තිබේ. මෙවැනි විදේශීය සබඳතා ශ්‍රී ලංකාවේ ආරාමික අධ්‍යාපනය දියුණු වීමට ද එහි යම් යම් වෙනස්කම් ඇති වීමට ද හේතු විය.

**පර්යේෂණ නිගමනය**

උක්ත අධ්‍යාපනයට අනුව පැරණි ශ්‍රී ලංකාවේ ආරාමික අධ්‍යාපන ව්‍යුහය විධිමත් අධ්‍යාපන ක්‍රමයක් වූ බව හඳුනා ගත හැකි ය. දැනුමෙන් පමණක් නො ව ආකල්ප කුසලතාවන්ගෙන් පිරි විනයානුකූල

ශිෂ්‍යයන් ඒ මගින් නිර්මාණය විය. ගුරු-ගෝල සබඳතාව වර්ධනය කළා වූ ඵලදායීතාවකින් යුත් අධ්‍යාපන ක්‍රමයක් ලෙස ද මෙය හඳුනා ගත හැකි ය. එම නිසාවෙන් වර්තමාන ජන සමාජයෙන් තුරුන් ව යමින් තිබෙන්නා වූ පැරණි ලංකාවේ ආරාම මුල් කොටගත් බෞද්ධ අධ්‍යාපනයේ සාධනීය ලක්ෂණයන් නූතන අධ්‍යාපන ක්‍රමයට උකහා ගැනීම වැදගත් වනු ඇත.

**ප්‍රමුඛ පද:** ලංකාව, ආරාමික, අධ්‍යාපනය, ගුරුවරයා, ශිෂ්‍යයා


මූලාශ්‍රය

- අබේසිංහ, වික්‍රමනායක (1999). **පැරණි ශ්‍රී ලංකාවේ ආරම අධ්‍යාපනය.** නුගේගොඩ: පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්.
- ඤාණවීර හිමි, රණස්ගල්ලේ (2007). **ඤාණාඤ්ජලී.** නුගේගොඩ: පියසිරි ප්‍රින්ටින්.
- ධම්මතිලක හිමි, පැලවත්තේ (1999). **බෞද්ධ අධ්‍යාපනය.** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.